# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 පෙබරවාරි මස 29 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

එල්. ඩී.— ඕ. 7/2008

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ආර්ථික සේවා ගාස්තුවක් අයකරනු ලැබිය යුතුය." යන වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ආර්ථික සේවා ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ පනතේ සහ මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ අපනයනය කිරීමෙන් පැන නගින පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තුවේ අනුප්‍රමාණය සියයට 0.25 නොඉක්මවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය." යන වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 2004 අංක 11 දරන මුදල් පනතේ 1 වන කොටසේ විධිවිධාන වලට අනුව ගෙවන ලදුව, එකී පනතේ විධිවිධාන අනුව 2006 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම්

අදාළ තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු වූ අදාළ ආදායම් බද්දෙන් අඩුකිරීමෙන් පසු යම් ආර්ථික සේවා ගාස්තු ප්‍රමාණයක් 2006 මාර්තු මස 31 වන දිනට ඉතිරිව ඇති විට—

(අ) ඒ ප්‍රමාණයේ, 2005 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා ගෙවූ යම් ආර්ථික සේවා ගාස්තු කොටසක් ඇතුළත් වේ නම්, ඒ කොටස 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුනෙහි එක් එක් තක්සේරු වර්ෂයට ; හෝ

(ආ) ඒ ප්‍රමාණයේ, 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා ගෙවූ යම් ආර්ථික සේවා ගාස්තු කොටසක් ඇතුළත් වේ නම්, ඒ කොටස 2006 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙහි එක් එක් තක්සේරු වර්ෂයට,

විභජනය කළ හැකි අතර, එසේ විභජනය කරන ලද ආර්ථික සේවා ගාස්තුවේ කොටස් එකී එක් එක් තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකළ හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) උපලේඛනයේ 4 වන සහ 5 වන අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්:—

"(4) (i) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 28 වන අයිතමය හැර ඒ උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව, ලාභ හා ආදායම මත ආදායම් බදු අය කළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක් ;

*සියයට 0.5*

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක් විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණවලට සමාන අනුප්‍රමාණවලට අනුව ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම මත බදු අයකල හැකි කාලසීමාව තුළ අදාළ පිරිවැටුම වන, 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

*සියයට 0.5*

4අ. (i) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 24 වන අයිතමය සහ 28 වන අයිතම හැර ඒ උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව, ලාභ හා ආදායම් මත ආදායම් බදු අය කළ හැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පැන නගින ආදාළ වන පිරිවැටුමේ යම් කොටසක්;

*සියයට 0.5*

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් ව්‍යවසායක් විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් අනුප්‍රමාණවලට සමාන අනුප්‍රමාණවලට අනුව ඒ ව්‍යවසායේ ලාභ හා ආදායම මත බදු අයකළ හැකි කාලසීමාව තුළ අදාළ පිරිවැටුම වන, 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

*සියයට 0.5*

5. වෙළෙන්දකු විසින් නිෂ්පාදනය නොකරන ලද මෝටර් වාහන හෝ මත්පැන්, තොග හෝ සිල්ලර වශයෙන් (බෙදාහරින්නකු නොවන) යම් වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක නිරතවීමෙන් ලැබෙන පිටුවැටුමේ ඇතුළත් වන පරිදි—

(i) 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

*සියයට 0.5*

(ii) 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

*සියයට 1.0*

(2) උපලේඛනයේ 11 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :—

"11. (i) යම් අපනයනකරුවකු විසින් ඇඟලුම් අපනයන කිරීමෙන් හෝ ඇඟලුම් අපනයනකරුවන්ට අපනයනය කරන ඇඟලුම් නිෂ්පාදනය කිරීමට භාවිත කිරීම සඳහා දේශීය වශයෙන් නිෂ්පාදිත රෙදි සැපයීමෙන් ලැබෙන පිරිවැටුමේ ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක් ;

*සියයට 0.1*

(ii) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් වෙළෙඳ ආයතනයක් ඇඟලුම් අපනයනය කිරීමෙහි නියැලී සිටිනතාක් දුරට එම වෙළෙඳ ආයතනයේ පිරිවැටුමේ ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දිනට පෙර පැන නගින අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

*සියයට 0.1*

11අ. (i) (අ) ඇඟලුම් අපනයනය කිරීමෙන්; හෝ

(ආ) අපනයනය කිරීම සඳහා යම් ඇඟලුම් නිෂ්පාදනය කරන අපනයනකරුවකුට දේශීය වශයෙන් නිෂ්පාදිත ඇඟලුම් සැපයීමෙන්;

(ඇ) යම් ඇඟලුම් අපනයනකරුවකුට අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කිරීමට දේශීයව නිෂ්පාදිත රෙදි පිළි සැපයීමෙන්,

ලැබෙන පිරිවැටුමේ;

(ii) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් වෙළෙඳ ආයතනයක් ඇඟලුම් අපනයනය කිරීමෙහි නියැලී සිටිනතාක් දුරට එම වෙළෙඳ ආයතනයේ පිරිවැටුමේ,

ඇතුළත් වන පරිදි 2008 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව අදාළ වන පිරිවැටුමේ යම් කොටසක්.

*සියයට 0.1*

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.